# එක් සේසත් රාජ්‍යයක් බිහිවීම හා එහි දේශපාලන න්‍යායික පදනම

ශ්‍රී ලංකාවේ රාජ්‍යයක් බිහිවීම පිළිබඳ තොරතුරු ජනප්‍රවාද, පරම්පරා කථා හා අද්භූත, ආශ්චර්යජනක සිද්ධීන්ගෙන් ගහණ ප්‍රබන්ධ වැනි මූලාශ්‍රය මාර්ග රාශියකින් පෝෂණය වීම නිසා නිශ්චිත නිගමන ඇතිව ඉදිරිපත් කිරීම දත් බොහෙවින් අපහසුය. වංසකතාගත තොරතුරු අනුව මේ රටේ රාජ්‍යයක් බිහි වූයේ විජය කුමරු අභිෂේක ලැබීමත් සමගය. 1 එහෙත් දේවානම් පියතිස්ස රජුගේ දෙවන අභිෂේකය ගැන වංසකතා ප්‍රවෘත විවරණය කරන වංසත්ථප්පකාසිනිය පවසන්නේ "අනය වූ අභිෂේක පරිහාරයෙන් නම් නැතෑ නුදෙක් නව යෂ්ටියක් දුරීමෙන්ම ඔහු රාජ්‍ය කෙරෙති".2 යනුවෙනි. තිස්ස රජු විසින් අශෝක අධිරාජයා වෙත යැවුණු දූතයන් තම රටේ රජවරුන්ගේ අභිෂේකය ගැන එම අධිරාජයාට කළ විස්තරය එයයි. මේ රටේ තිස්ස රජුගේ කාලය වනතුරු අභිෂේක ලැබූ රජුන් නො සිටි බව එයින් පැහැදිලි වේ.

මෙම දිවයිනේ රාජ්‍යයක් හෝ රාජ්‍ය බිහිවීම පිළිබඳව සලකා බැලීමේදී වංසත්ථප්පකාසිනිය කරන ඉතා විස්තරයෙන් අපට අනුමාන වශයෙන් හෝ ගත හැකි යමක් ඇත. එනම් මේ රටේ රාජ්‍ය බිහිවීම කිසිසේත් උතුරු ඉන්දියාවේ ගංගා-යමුනා තැනිතලාවේ හෝ ඒ ආශ්‍රිත ප්‍රදේශවල රාජ්‍ය බිහිවීම හා එක් ව ගෙන අධ්‍යයනය කළ නො හැකි බවය. ගංගා යමුනා තැනිතලාවේ රාජ්‍ය බිහිවූයේ බ්‍රාහ්මණ ඉගැන්වීම් මගින් පෝෂිත වූ ඒකාධිපතිත්වය පදනම් කර ගෙනය. එහෙත් අප දන්නා ඉන්දියානු ඉතිහාස තොරතුරු අනුව එම තත්වය නොපිළිගත් බොහෝ ආර්ය ගෝත්‍රික ජනයා සිය අනන්‍යතාව රැක ගෙන එයට ගැළපෙන අයුරුම් දේශපාලන සංවිධාන ඇති කර ගත්හ. ඒවා ඉන්දියානු මූලාශ්‍රයවල හැඳින්වෙන්නේ ගණ හෝ සංඝ රාජ්‍ය නමිනි.2 ලංකාවේ ජනාවාස තනා ගත් ආර්ය කණ්ඩායම්වලට අයත් ජනයා ද මෙබඳු අභිලාෂයන්ගෙන් පොළඹවන ලද පිරිසක් බවද අප විසින් කරන ලද පරීක්ෂණවලදී පෙනී ගොස් ඇත.3 මෙරට රාජ්‍යයක් හෝ රාජ්‍ය බිහි වීම පිළිබඳව අධ්‍යයන කළ යුත්තේද මේ පසුබිම මැනවින් සිහියේ තබා ගෙනය.

මෙතෙක් ඉතිහාසඥයන්ගේ වැඩි අවධානයට ලක් නො වූ කරුණක්ද මෙහිදී සලකා බලමු. තරමක් හෝ විශ්වාසදායක තත්වයෙන් පිළිගත හැකි රාජ්‍ය කාලයක් වූ පණ්ඩුකාභය රාජ්‍ය කාලය ගැන කෙරෙන විස්තරයේදී අනුරාධපුර නගරය තැනවීම ගැන සඳහන් වෙයි.4 එම නගරය සැලසුම් කළ නිර්මාණ ශිල්පියා වූයේ ජෝතිය නම් ජෛන පූජකවරයෙකි. රජු නගරයේ ඒ ඒ තැන ගොඩනැගිලි තැනීමෙහි 'ජෝතිය' නම් වූ නගර නිර්මාපක බ්‍රාහ්මණයා සඳහාද ආරාමයක් තැනවී යයි වංසත්ථප්පකාසිනිය එය පැහැදිලි කරයි.5 නගරයේ උතුරෙන් වූ එම ආරාමය සමග ගිරි නම් නිගණ්ඨාරාමය, කුම්භණ්ඩ නම් නිගණ්ඨාරාමය වැනි ආගමික ගොඩනැගිලි රාශියක් විය. මෙරට ආදි ජනාවාස බිහිවීමේදී ජෛන ආගම ඇදහූ ජනයා විශාල කණ්ඩායම් වශයෙන් මෙරටට සංක්‍රමණය වී සිටින්නට ඇතැයි යන අනුමානයක් මෙහි දී ඇති කර ගත හැකිය. බෞද්ධයන් මෙන්ම ජෛනයෝද උතුරු ඉන්දියාවේ වර්ධනය වූ බ්‍රාහ්මණ ආධිපත්‍යය හා රජුන්ගේ ඒකාධිපතිත්වය නොපිළිගත් පිරිසක් වූහ.6 බුදුන් වහන්සේ අයත් වූ ශාක්‍ය වංශය මෙන්ම ජෛන මහාවීරතුමා අයත් වූ ඥාත්‍රික වංශයද හිමාලය බද කඳුකරයේ ගණ රාජ්‍ය ඇතිව සිටි පිරිස් වූහ.7 ලංකාව ජනාවාස කර ගත් බොහෝ පිරිස් ගංගා-යමුනා තැනිතලාවේ ප්‍රධාන ආර්ය ජන ප්‍රවාහයට අයත් නො වූ ආර්ය ගෝත්‍රවලට අයත් වූ ජනයා බව මහාවංසයේ එන විජය කථා ප්‍රවෘත කියැවීමේදී මැනැවින් පැහැදිලි

